Australian Government

COVID-19 VACCINATION

# COVID-19 ආසාදනයේ දීර්ඝ කාලීන බලපෑම්

2022 ජූනි 27

COVID-19 ආසාදනය වන බොහෝ අය තුල කෙටි කාලයක් රෝග ලක්‍ෂණ තිබෙන අතර සති කිහිපයකදී සුවය ලබයි. COVID-19 හේතුවෙන් සුවවීමට ගතවන කාලය එක් එක් පුද්ගලයා අනුව වෙනස්වේ. මෙය තීරණය වන්නේ COVID-19 හේතුවෙන් ඔබ කොතරම් අසනීප වුණිද යන්න මතය. ඔබට වෙනත් පවතින රෝගී තත්වයන් ඇතිද යන්න මතද මෙය තීරණයවේ.

COVID-19 ආසාදනය වුණු පසු දීර්ඝ කාලීන සෞඛ්‍යය ගැටළු ඇති අයද සිටී. සමහර අවස්ථාවල COVID-19 ආසාදනය හේතුවෙන් මුලින් අසනීප වීමෙන් පසු මාස කිහිපයක් අසනීපවී සිටින අවස්ථාද ඇත. මෙය දීර්ඝ කාලීන කෝවිඩ් ආසාදන (Long COVID) ලෙස හඳුන්වයි. දීර්ඝ කාලීන කෝවිඩ් ආසාදනය වන අය තුල තව දුරටත් වයිරසය නැති වුවද, සති හෝ මාස ගණනක් අසනීපවී සිටිය හැකිය.

දීර්ඝ කාලීන කෝවිඩ් ඇතිවීමේ හැකියාව ඇත්තේ දරුණු ලෙස COVID-19 ආසාදනය වුනු අයටවේ. කෙසේවුවද, ඉතා අඩු වශයෙන් COVID-19 ආසාදනයවුණු අයට වුවද දීර්ඝ කාලීන කෝවිඩ් ඇතිවීමේ හැකියාව ඇත.

## දීර්ඝ කාලීන කෝවිඩ් ආසාදනයේ රෝග ලක්‍ෂණ

දීර්ඝ කාලීන කෝවිඩ් හේතුවෙන් රෝග ලක්‍ෂණ බොහෝමයක් ඇතිවිය හැකි වුවද, සෑම දෙනා හටම එකම ආකාරයට බලපාන්නේ නැත. COVID-19 ආසාදනයට පසුව හෝ ආසාදනයෙන් සුවවීමෙන් පසුව වුවද නැවත රෝග ලක්‍ෂණ ඇතිවිය හැකිය.

වාර්තාවී ඇති ඉතාම බහුල රෝග ලක්‍ෂණ සහ තත්වයන් අතර පහත දේ ඇත:

- වෙහෙසකර බව
- හුස්ම ගැනීමේ අපහසුව
- දිගටම පවතින කැස්ස
- පපුවේ වේදනාව
- හන්දිපත් රුදාව
- ව්‍යායාම කිරීමට ප්‍රමාණවත් නොවන ශක්තිය
- උණ
- හිසේ කැක්කුම
- මතකය සහ පැහැදිලිව සිතීම පිළිබඳ ගැටළු (‘brain fog’)
- විෂාදය හෝ උත්සුක බව (depression, anxiety).

## දීර්ඝ කාලීන කෝවිඩ් වැළැක්වීම

දීර්ඝ කාලීන කෝවිඩ් වැළැක්වීම සඳහා හොඳම ක්‍රමය වන්නේ COVID-19 වයිරසය ආසාදනයවීමෙන් ආරක්‍ෂාවීමයි.

COVID-19 ආසාදනය සම්බන්ධ අවදානම අඩු කිරීමට හැකි හොඳම ක්‍රමය වන්නේ එන්නතයි.

පර්යේෂණ මගින් යෝජනා වී ඇත්තේ COVID-19 ආසාදනයට එරෙහිව එන්නත ලබා ඇති අය එන්නත ලබා නොගත් අයට වඩා දීර්ඝ කාලීන කෝවිඩ් රෝග ලක්‍ෂණ වාර්තා කිරීමේ අවස්ථා අඩු බවයි.

## වැඩිදුර විස්තර සඳහා

ඔබ සති කිහිපයකට පෙර COVID-19 ආසාදනය ඇති බවට පරීක්‍ෂණයකින් සනාථවුණි නම්, සහ ඔබට තවම සුවවී නැතිනම්, ඔබගේ වෛද්‍යවරයා සමඟ කථා කරන්න.

වැඩිදුර විස්තර සඳහා health.gov.au/covid19-vaccines-languages වෙබ් අඩවිය වෙත පිවිසෙන්න, නැතිනම් දුරකථන අංක 1800 020 080 ඔස්සේ ජාතික කොරෝනා වයිරස් උපකාර අංකය අමතන්න. භාෂා පරිවර්තන සේවා සඳහා 8 වන විකල්පය තෝර ගන්න.